# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1342/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 19/08/2024 පැය 1135

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. නීති විරෝධී දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.08.18 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් විසින් මීගමුව පොලිස් වසමේ පෙරියමුල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර නීති විරෝධී දුම්වැටි 1020 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුර.**

2024.08.18 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන් විසින් අවිස්සාවේල්ල පොලිස් වසමේ තල්දූව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 180 ක් හා ජංගම දුරකථන 03 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අවිස්සාවේල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන තල්දූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** අවිස්සාවේල්ල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. කේරළ ගංජා සමඟ සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඕමන්ත කඳවුර.**

2024.08.18 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ඕමන්ත කඳවුරේ නිලධාරීන් විසින් ඕමන්ත පොලිස් වසමේ සිදම්බරම්පුරම් හන්දිය ආසන්න ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කාර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි කේරළ ගංජා කිලෝ 01 ග්‍රෑම් 970 ක්, ජංගම දුරකථන 04 ක් හා මත්ද්‍රව්‍ය අලෙවියෙන් උපයාගත් බවට සැක කරනු ලබන මුදල් රුපියල් 38,000/= සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඕමන්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 හා 38 වයස් වල පසුවන ඉකිරිගොල්ලැව හා කොළඹ 15 ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** ඕමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**